**සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම - 2017/2018**

---

සීමාසහිත පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගමේ 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

---

**(අ) සමාගමේ අඛණ්ඩ පැවැත්ම**

---

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ ආකෘතිමය රාමුවට අනුව ආයතනයේ අඛණ්ඩභාවය පිළිබඳ පදනම යෝග්‍ය වන්නේ ද යන්න තක්සේරු කිරීමේ දී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා වගකිව යුතු පාර්ශවයන් වර්තමාන සහ අපේක්ෂිත කාර්යසාධනය පිළිබඳව විශාල පරාසයක සාධක, ආයතනික ඒකක ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ දැනුම්දීම, ඒ හා දැ සිදුවීමේ ශක්‍යතාවය අයහාර ඇස්තමේන්තු හෝ රජයේ අරමුදල්කරණය දිගින් දිගට ම පැවතීමේ හැකියාව සහ මූල්‍යකරණය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ දී ශක්‍යතාවයක් ඇති ප්‍රභවයන් යනාදී කරුණු ගැන සැලකිලිමත් විය යුතුය.

පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගමේ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩභාවය පිළිබඳ උපකල්පනය මත පිළියෙල කර තිබුණ ද, පහත සඳහන් කරුණු හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(i) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 30 යටතේ දක්වා ඇති කරුණු

(ii) සමාගම විසින් 2017 මාර්තු 31 දින දක්වා ලීටර් 69,630 ක්ද, එදින සිට 2017 ජුනි 30 දින දක්වා ලීටර් 19,070 ක්ද වශයෙන් දැවි තෙල් ලීටර් 88,700 ක් නිෂ්පාදනය කර තිබූ අතර නිෂ්පාදිතයන් අලෙවි කිරීමට වෙළඳපොළක් නොමැති වීම නිසා දැවි තෙල් ලීටර් 46,841 ක් පමණක් රු.40 බැගින් අලෙවි කර තිබීම.

(iii) නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරගෙන යාමට නොහැකි වීම නිසා අපේක්ෂිත පරිදි නිෂ්පාදන ඉලක්ක කරා ළඟා වීමට නොහැකි වීම හා නිෂ්පාදනයේදී සෑම ඒකකයකින්ම රු. 310 ක නිෂ්පාදන අලාභයක් සිදු වී තිබීම.

(iv) 2018 මාර්තු 31 දිනට භාණ්ඩාගාරයෙන් රු.මිලියන 263.5 ක් ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබුණ ද එදිනට ව්‍යාපෘතියෙන් ලද ආදායම රු. 1,892,540 ක් පමණි. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේදි සමාගම ලබා තිබූ අලාභය රු. 22,392,638 ක් වන අතර එදිනට සමුච්චිත අලාභය රු. 156,613,667 ක් විය. තවද, 2018 මාර්තු 31 දිනට සමාගමේ ජංගම වගකීම් එහි ජංගම වත්කම් රු. 6,393,548 කින් ඉක්මවා තිබූ බව නිරීක්ෂණය වීම.

(v) සමාගමේ සභාපතිවරයා 2017 මැයි 23 වන දින ඉල්ලා අස් වී තිබූ අතර 2018 අගෝස්තු 31 දින වන විටත් නැවත සභාපතිවරයෙකු පත් කර නොතිබීම.

(vi) සමාගමේ කාර්ය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී ඇතුළුව මාණ්ඩලික නිලධාරින් හතරදෙනෙකු ඉල්ලා අස් වී තිබුණු අතර ඒ සඳහා නැවත බඳවා ගැනීම් සිදු කර නොතිබීම.

(vii) 2018 මැයි 15 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් පහත කරුණු සඳහා අනුමැතිය ලබා දීම.

- ගරු නීතිපතිතුමාගේ නිෂ්කාශනයට යටත්ව මෙහෙයුම් ගිවිසුම අත්සන් කිරීමෙන් පොලිප්ටෝ යන්ත්‍රාගාරයේ මෙහෙයුම්වල අයිතිය සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 30 ක අයිතිකරු වන නවෝත්පාදක හා පේටන්ට් බලපත්‍රලාභියා වෙත භාරදීමට හැකි වන පරිදි පවත්නා සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම.

- ප්‍රවර්තන නිෂ්පාදන ක්‍රියාකාරකම් පමණක් පවත්වා ගෙන යාමට සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගමේ නිෂ්පාදක අදහස් කරයි නම්, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති තක්සේරු වාර්තාව ප්‍රකාර රු. 82,019,500 ක් වූ මුළු වත්කම් වටිනාකම ආපසු ගෙවීම පිණිස රජය විසින් වසර 10 ක සහන කාලයක් සැලසිය යුත්තේය යනුවෙන් විද්වත් කමිටුව විසින් නිර්දේශිත ඡේදයේ සඳහන් පරිදි ක්‍රියාත්මක වීම සඳහා ඉහත සඳහන් නවෝත්පාදකට පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගමේ මෙහෙයුම් කටයුතු භාරදීම.

- ඉහත ඡේදයේ සඳහන් මුළු වත්කම් වටිනාකම රජයට ආපසු ගෙවීමෙන් පසුවත් උපයන ලාභයෙන් සියයට 10 ක් වාර්ෂිකව රජයට අඛණ්ඩව ගෙවන ලෙසට නවෝත්පාදකට උපදෙස් දීම.

- දැනට සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගමට අයිතිය පවතින අක්කර 11 ක ඉඩමේ බද්ද, රජයේ හා නවෝත්පාදක අතර අත්සන් තැබෙන එකී ගිවිසුමේ දිනයේ සිට නවෝත්පාදක වෙත මාරු කිරීමට පියවර ගන්නා ලෙස ආයෝජන මණ්ඩලයට විධානය කිරීම, ගිවිසුම අත්සන් කරනු ලබන දිනයේ සිට ඔහු විසින් අක්කර 11 ක ඉඩමේ කුලිය ගෙවීම.

- ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට අදාල ඉතිරි කටයුතු ක්‍රියාත්මක කිරීමට ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ට බලය පැවරීම සහ දැනට තිබෙන අධ්‍යක්ෂක මණ්ඩලය තවදුරටත් වලංගු නොවන ලෙස සැලකීම.

- මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන්වන තෙක්, සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගමේ දැනට සිටින සේවකයින්ගේ වැටුප් හා වේතන සඳහා අවශ්‍ය රු. මිලියන 1 ක මුදල වෙන්කරන ලෙසද, සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම විසින් පෙර ඉටු කරන ලද කාර්යයන් සඳහා වූ බිල්පත් පියවීම සඳහා රු. මිලියන 8.5 ක මුදලක් නිදහස් කරන ලෙසද, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ට නියෝග කිරීම.

- සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගමේ ඉහත යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීම ඉෂ්ට නොවන්නේ නම්, මෙම යන්ත්‍රාගාරයේ වත්කම් ඇවරකර, ඒකාබද්ධ අරමුදලට ඇවර වටිනාකම මාරුකිරීම.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

-----------------------------

(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 හි 09 ඡේදය ප්‍රකාරව තොගවල අගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත මැනිය යුතු වුවත් 2018 මාර්තු 31 දිනට සමාගමේ අවසාන තොගය තුළ වූ ශුද්ධ උපලබ්ධි අගය රු. 1,642,480 ක් වූ පොලිප්ටෝ තෙල් ලීටර් 41,062 ක් එහි පිරිවැය වූ රු. 2,354,588 ක් පදනම් කර ගෙන ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂ අවසාන දිනට ජංගම වත්කම්වල වටිනාකම රු. 712,108 කින් වැඩියෙන් ද සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ii) දේපල, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලාදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 3,188,978 ක් වූ අයිතම 27 ක් සම්පූර්ණයෙන් ම ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38 හි 104 ඡේදය ප්‍රකාරව සීමිත ඵලදායී ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය කල යුතු කාලය හා ක්‍රමය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීවත් සමාලෝචනය කළ යුතු වුවද, එසේ නොකිරීම හේතුවෙන් රු. 284,864 ක් වටිනා පරිගණක මෘදුකාංගයක් සම්පූර්ණ වශයෙන් ක්‍රමක්ෂය කර තිබුණ ද තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

වෙනත් දේපළ පිරියත හා උපකරණ යටතට ගැනෙන පිරිවැය රු. 5,753,141 ක් වන වත්කම් අයිතම 04 ක්, සමාගමේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව වාර්ෂිකව සියයට 10 ක් හෙවත් රු.575,313 ක් ක්ෂය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී සියයට 20 ක් හෙවත් රු. 1,150,627 ක් ක්ෂය කර තිබුණි. ඒ හේතුවෙන් 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශුද්ධ

අලාභය රු. 575,313 ක් වැඩියෙන්ද එදිනට ජංගම නොවන වත්කම් වල අගය රු. 575,313 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල රජයෙන් ලබාදුන් ණය වශයෙන් රු. 173,649,984 ක් දක්වා තිබූ අතර එය සනාථ කර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ආයතනය තුලින් ලබා ගැනීමට නොහැකි විය.

(ii) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල අමාත්‍යාංශයෙන් ලද ප්‍රදාන ලෙස රු. 992,540 ක් ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණු අතර මේ සම්බන්ධ උපලේඛනය අවසන් ගිණුම සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය ව්‍යාවනය

-------------------

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිලිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය මඟින් නියමකර ඇති පරිදි පහත සඳහන් කරුණු දක්වමි.

(අ) විගණන මතයේ පදනම, විෂය පථය හා විගණනයේ සීමා කිරීම් ඉහත සඳහන් පරිදි විය.

(ආ) මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති වැදගත් සීමා කිරීම්වලට යටත්ව,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් ප්‍රමාණවත් ලෙස මවිසින් ලබාගන්නා ලද බවත්, මගේ පරීක්ෂණ මඟින් පෙනීයන පරිදි සමාගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පනතේ 151 වගන්තියේ නියමයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

(ඇ) සමාගම් පනතේ 220 වගන්තියේ නියම කර ඇති විධිවිධානයන්ට අනුව සමාගම කටයුතු කර නොතිබුණි.

## 2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනත (i) 167 වගන්තිය | සෑම සමාගමකටම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ ශේෂ පත්‍ර දිනෙන් පසු මාස 06 ක් ඇතුළත අදාල ශේෂ පත්‍ර දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදයක් තුළ සමාගමේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් සකස් කල යුතු අතර මෙම වාර්ෂික වාර්තාවේ පිටපතක් කොටස් හිමියන්ගේ වාර්ෂික රැස්වීම පවත්වන දිනයට වැඩ කරන දින 15 කට පෙර සෑම කොටස්කරුවකු වෙතම යැවිය යුතු වුවත් සමාගම විසින් 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |
| | (ii) 220(1) වගන්තිය | සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 187,500,000 ක් වන 2015/2016, 2016/2017 හා 2017/2018 යන වර්ෂ වල මාර්තු 31 දිනට ශුද්ධ වත්කම් වල වටිනාකම පිළිවෙළින් රු. 90,889,142 ක්, රු. 53,278,971 ක් හා රු. 30,886,333 ක් විය. සමාගමේ ශුද්ධ වත්කම් එම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් හරි අඩකට වඩා අඩු බව යම් අවස්ථාවකදී ඒ සමාගමේ අධ්‍යක්ෂවරයෙකුට පෙනී යන්නේ නම් , ඒ බව ඒ අධ්‍යක්ෂවරයාට දැන ගැනීමට ලැබීමෙන් පසු වැඩ කරන දින විස්සක් ඇතුළත දී, සමාගමේ කොටස් හිමියන්ගේ අතිවිශේෂ මහ සභා රැස්වීමක් ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කැඳවනු ලැබිය යුතු අතර, ඒ රැස්වීම, එසේ කැඳවනු ලැබූ දින සිට වැඩ කරන දින 40 ක් පසු වීමට පෙර පවත්වනු ලැබිය යුතු ය. නමුත් සමාගම එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1980 අංක 46 දරන සේවානියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 16 වගන්තිය | සේවායෝජක විසින් සේවා නියුක්තිකයා තම සේවයේ නියුක්ත කරනු ලබන එක් එක් මාසය වෙනුවෙන් එම මාසය ඇතුළත ඒ සේවායෝජකයාගේ සේවයේ නියුක්ත වීමෙන් ඒ සේවා නියුක්තිකයා උපයන මුළු ඉපයීම්වලින් සියයට 03 කට පමණ වන දායක මුදල් ඊළඟට එළඹෙන මාසයේ අවසාන දින හෝ එදිනට පෙර සේවා නියුක්තිකයා සම්බන්ධව අරමුදලට බැර කල යුතු වුව ද මෙම සමාගම 2017 පෙබරවාරි මස සිට 2017 මැයි මස දක්වා මාස 04 ක කාලයක් සඳහා නියමිත දිනට දායක මුදල් ගෙවා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 156(7) හා 780 | ගෙවීම් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන් ගෙවීම් සිදු කිරීමේ දී නිසි විචක්ෂණභාවයෙන් සැලැසුම්කර, කාර්යක්ෂමව හා අරපිරිමැස්මෙන් කටයුතු නොකිරීම හේතුවෙන් අවස්ථා 02 දී රු. 12,394 ක් හා රු. 3,566 ක් |

| | | |
|---|---|---|
| | | වශයෙන් එකතුව රු. 15,960 ක් අධිභාර වශයෙන් පිළිවෙලින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට හා සේවක අර්ථසාධක අරමුදලට ගෙවා තිබුණි. |
| (ඈ) | 2009 පෙබරවාරි 19 වන දින මධ්‍යම පරිසර අධිකාරිය, ඉවතලන ප්ලාස්ටික් අපද්‍රව්‍ය වලින් ඉන්ධන නිපදවීමේ පේටන්ට් බලපත්‍ර හිමිකරු සමඟ ඇති කර ගන්නා ලද බද්ධ ව්‍යාපාර ගිවිසුමේ 4.1 වගන්තිය සහ පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 3.1(1)(**i**) ව්‍යවස්ථාව | සමාගමේ නිකුත් කළ ප්‍රාග්ධනය කොටසක මිල රු. 10 බැගින් වූ සාමාන්‍ය කොටස් 18,750,000 කින් සමන්විත වුව ද 2018 මාර්තු 31 වන දිනට ඉන් කොටස් 10 ක් පමණක් නිකුත් කර තිබුණි. |
| (ඉ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් තම පාලක මණ්ඩලයේ අනුමැතිය ඇතිව සිය සේවකයින්ට ගෙවීමට හැකි අතර, අවශ්‍ය අධිකාරී බලය නොලබා සිය සේවකයින්ට අතිරේක දීමනා, දිරිදීමනා හා වෙනත් ගණයේ මූල්‍ය ප්‍රතිලාභ ගෙවීමට නොහැකිය. නමුත් ඊට අනුගත නොවී සමාලෝචිත වර්ෂය තුළ විවිධ දීමනා වශයෙන් නිලධාරීන් 16 දෙනෙක් සඳහා රු. 873,361 ක් හා සමාගමේ කළමනාකරණ මණ්ඩල තීරණ 99 පරිදි වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයාට (මූල්‍ය) හා වැඩබලන අභ්‍යන්තර විගණකට වැඩබැලීමේ දීමනා ලෙස රු. 374,719 ක් ගෙවා තිබුණි. |
| (ඊ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/2/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සන්නිවේදන පහසුකම් හිමි නොවන නිලධාරින් 06 දෙනෙකු සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම වෙනුවෙන් සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා රු. 25,041 ක් ගෙවා තිබුණ බව නිරීක්ෂණය විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 22,392,638 ක ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අලාභය රු. 35,174,148 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 12,781,510 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේදී විකුණුම් ආදායම රු. 1,313,260 කින් අඩු වී හා ඉකුත් වසරේ රු. 57,467 ක් වූ වෙනත් ආදායම් ලැබීම් සමාලෝචිත වර්ෂයේදී අහිමි වී තිබුණ ද විකුණුම් පිරිවැය, මෙහෙයුම් වියදම හා මූල්‍ය වියදම පිළිවෙලින් රු.3,456,993 කින්, රු.10,691,569 කින් හා රු. 3,675 කින් අඩුවීම ඉහත වර්ධනයට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 03 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2014/2015 වර්ෂයේ රු. 15,613,789 ක් වූ ශුද්ධ අලාභය 2015/2016 වර්ෂය වන විට රු. 24,918,651 ක හා 2016/2017 වර්ෂය වන විට රු. 35,174,148 ක ශුද්ධ අලාභයක් දක්වා පිරිහී තිබුණු අතර එය 2017/2018 වර්ෂයේ දී රු. 22,392,638 ක ශුද්ධ අලාභයක් දක්වා වර්ධනය වී තිබුණි. සමාගමේ මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ගැලපීමෙන් පසු 2014/2015 , 2015/2016, 2016/2017 වර්ෂ හා සමාලෝචිත වර්ෂයේ දායකත්වයන් පිළිවෙලින් රු. 9,760,637, රු.14,523,826, රු.19,668,621, හා රු. 10,384,796 ක ශුද්ධ අලාභයක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉවතලන ප්ලාස්ටික් ඉන්ධන බවට පරිවර්තනය කිරීම මගින් අවිධිමත් ආකාරයට බැහැර කරන්නා වූ ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර ව්‍යසනය අවම කර ගැනීමත්, ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය සඳහා වැය වන පිරිවැය අවම කිරීම හා එමගින් විදේශ විනිමය ඉතිරි කර ගැනීමත්, නව නිපැයුම්කරුවකුගේ බුද්ධිමය දේපල ඇගයීම් කරනු වස් ඒ සඳහා වාණිජමය වටිනාකමක් ලබා දී එම නව නිර්මාණය ජාතිකමය වූ වත්කමක් බවට පත් කිරීම මගින් තරුණ පරම්පරාවට නව නිර්මාණ සඳහා වැඩි වැඩියෙන් යොමු වීමට අවශ්‍ය නව ආකෘතියක් හඳුන්වා දීමත්, ඉන්ධන නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තශාලාව මගින් ජනිත කරවන්නා වූ සෘජු රැකියා වලට අමතරව ඉවතලන ප්ලාස්ටික්, පොලිතින් එකතු කරන්නන් ලෙස ස්වයං රැකියා අවස්ථාවන් ජනිත කිරීමත්, ඉවතලන ප්ලාස්ටික් වලින් ලබා ගන්නා ඉන්ධන වෙනත් වටිනා නිෂ්පාදන බවට පරිවර්තනය කිරීමේ සහ ත්‍රීවිල් සඳහා යොදා ගත හැකි ඉන්ධනයක් බවට පත් කිරීමේ හැකියාව සොයා බැලීම සඳහා තවදුරටත් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීමත්, තාක්ෂණික වශයෙන් ඉතා සුපිරි තත්ත්වයේ පවතින මෙම නව නිර්මාණය සඳහා ගෝලීය වශයෙන් පිළිගැනීමක් ඇති කර ගැනීම සඳහා එය තවදුරටත් පුළුල් කිරීම හා අලෙවිය සමාගමේ අරමුණ වේ.

සමාගමේ අරමුණු ඉටු කරගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

පසුගිය වසරේදීද විගණන වාර්තාවෙන් පෙන්වා දුන් පරිදි ප්ලාස්ටික් අපද්‍රව්‍ය වලින් ඉන්ධන නිපදවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී නිසි පරිදි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයන් නොකිරීම, නිෂ්පාදන සඳහා වෙළඳපොළ හඳුනා නොගැනීම, නියමු ව්‍යාපෘතිය අර්ධ වාණිජ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන බාධක හා ගැටළු හඳුනාගෙන ඒවා මග හරවා ගැනීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක නොකිරීම, අවශ්‍ය ප්‍රමාණවත් යටිතල පහසුකම් නොතිබීම, අරමුදල් නිසි කලට නොලැබීම හා

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී නිෂ්පාදන කළමනාකරණය ඉතා දුර්වල මට්ටමක පැවතීම වැනි කරුණු හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු කරා ළඟා වීමට නොහැකි වී එය ඉතා අසාර්ථක ව්‍යාපෘතියක් බවට පත් වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(i) ඉවතලන ප්ලාස්ටික් ඉන්ධන බවට පත්කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයේදී පිරිවැය ප්‍රතිලාභ නිවැරදිව හඳුනාගෙන නොතිබීම හේතුවෙන් ලීටරයක විකුණුම් මිල රු. 40 ක් වුවත් නිෂ්පාදන පිරිවැය රු.350 ක් වී තිබුණි.

(ii) නිෂ්පාදනය කරන දැව්තෙල්, බොයිලේරු සඳහා දහන ඉන්ධනයක් ලෙස භාවිතා කළ හැකි බව පමණක් හඳුනාගෙන තිබුණු නමුත් ඉන්ධන වෙළඳපොලේ දැඩි තරඟකාරිත්වය, ආදේශන ඉන්ධන භාවිතය, ආදේශන ඉන්ධන වල (භූමිතෙල්) තරඟකාරී මිලක් පැවතීම ආදී කරුණු පිළිබඳව සැලකිලිමත් නොවීම නිසා නිපදවන ලද දැව් තෙල් අලෙවි කිරීම ඉතා අසාර්ථක වූ බැවින් විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මඟින් සමාගම විසින් නිපදවන ලද දැව් තෙල් ලීටර් 88,700 න් ලීටර් 46,841 ක් රු. 40 බැගින් පෞද්ගලික ආයතනයකට අලෙවි කර තිබුණි.

(iii) නියමු ව්‍යාපෘතියෙන් අත්කර ගත් ප්‍රතිඵල අනුව ඉවතලන ප්ලාස්ටික් ඉන්ධන බවට පත් කිරීමේ ක්‍රියාවලිය තාක්ෂණික, පාරිසරික හා ආර්ථික වශයෙන් සාර්ථක බව තීරණය කර එමෙන් දස ගුණයක් විශාල අර්ධ වාණිජ පර්යන්තයක් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණද ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන බාධක, ගැටළු හඳුනාගෙන ඒවා මග හරවා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv) අර්ධ වාණිජ පර්යන්තයක් බවට පත් කිරීමෙන් පසු ඒ සඳහා අවශ්‍ය ප්‍රමාණවත් යටිතල පහසුකම් පිළිබඳ අවධානය යොමු කර එම පහසුකම් කල්තියා සපයා ගැනීමට සැලසුම් කර නොතිබුණි.

(v) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ප්ලාස්ටික්, පද්ධතියට ඇතුළත් කිරීම සඳහා නියමිත ක්‍රමවේදයක් ආරම්භයේ දී නොතිබුණ අතර නියමු ව්‍යාපෘතියේ සිට මේ දක්වා ක්‍රමවේද පහක් පමණ අත්හදා බලා තිබුණි. මේ වන විට ප්ලාස්ටික්, පද්ධතියට එකතු කරනු ලබන්නේ භාවිතයෙන් ඉවත්කරන ලද තෙල් සමඟ මිශ්‍ර කරගෙන වන අතර මෙහිදී නිෂ්පාදනය කරනු ලබන දැව්තෙල් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් භාවිතයෙන් ඉවත්කරන තෙල් යෙදවුම් වශයෙන් නිෂ්පාදන ක්‍රියාවලියට ඇතුළත් කර තිබුණි.

සමාගම විසින් නිෂ්පාදනය ආරම්භයේ සිට 2018 මාර්තු 31 දින දක්වා දැව්තෙල් ලීටර් 88,700 ක් නිෂ්පාදනය කර තිබුණු අතර ඒ සඳහා ප්ලාස්ටික් සමඟ ඍජු හා වක්‍ර යෙදවුම් වශයෙන් භාවිතයෙන් ඉවත් කරන ලද තෙල් ලීටර් 95,200 ක් යොදාගෙන තිබුණි. ඒ අනුව දැව් තෙල් ලීටරයක් නිපදවීම සඳහා යෙදවුම් වශයෙන් භාවිතයෙන් ඉවත්කරන ලද ලීටර් 1.07 ක් යොදාගෙන තිබුණි.

(vi) පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම විසින් 2018 මාර්තු 31 දිනට නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගත නොහැකි වැලි මිශ්‍රිත ප්ලාස්ටික් කුඩු කිලෝග්‍රෑම් 3,494 ක් ද, නිෂ්පාදන ක්‍රියාවලියේදී බැහැර කරන අපද්‍රව්‍ය ද්‍රව වශයෙන් ලීටර් 17,350 ක් ද, ඝන වශයෙන් කිලෝග්‍රෑම් 2,000 ක් ද, පරිසරයට බැහැර කිරීමේ හිතකර පිළිවෙතක් නොමැති බැවින් කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ටැංකි හා බහාලුම් වල ගබඩා කර තිබුණි. මෙම අපද්‍රව්‍ය පරිසර හිතකාමී හා නීත්‍යානුකූල අයුරින් බැහැර කිරීම සඳහා සමාගම විසින් ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් හඳුනාගෙන නොතිබුණි.

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---

ඉවතලන ප්ලාස්ටික් ඉන්ධන බවට පරිවර්තනය කිරීම මඟින් අවිධිමත් ආකාරයට බැහැර කරන්නා වූ ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර ව්‍යසනය අවම කර ගැනීමේ ප්‍රධාන අරමුණින් යුක්තව 2009 අගෝස්තු 19 වන දින මධ්‍යම පරිසර අධිකාරිය යටතේ පිහිටුවනු ලැබූ පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම, 2010 ඔක්තෝබර් 04 දින සිට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය යටතටත් 2013 පෙබරවාරි 06 දින සිට තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතටත් පත් වූ අතර 2015 සැප්තැම්බර් 21 සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවතුණි. මෙසේ සමාගම අමාත්‍යාංශයන් යටතට මාරු වීම හේතුවෙන් සමාගමේ කාර්යසාධනයට අහිතකර බලපෑමක් සිදුවන බව නිරීක්ෂණය විය.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

සමාගමේ කාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---

**5.1 ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම**

---

මුදල් රෙගුලාසි 234(2) ප්‍රකාරව පොදු ආකෘති පත්‍ර 58 හි නියමිත ආකෘතිය ප්‍රකාර මුදල් පොත හා සමාලෝචිත වර්ෂය සඳහා වූ උපයෝගී පොත් හා ලෙජර ගිණුම් විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි.

**5.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන දින 81 ක් ප්‍රමාද වී 2018 අගෝස්තු 21 දින ඉදිරිපත් කර තිබුණි.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 05(2) වගන්තිය අනුව ව්‍යාපාරික සැලැස්ම පදනම් කරගෙන ඉදිරි මුදල් වර්ෂයේ දී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුලත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවත් මානව සම්පත් සංවර්ධන සැලැස්ම, ණය ආපසු ගෙවීමේ සැලැස්ම ඇතුලත් වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.4 අභ්‍යන්තර විගණනය**

---

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර විගණන වැඩසටහනක් හෝ ප්‍රමාණවත් විගණනයක් සිදු කර නොතිබුණි. නමුත් වැඩබලන අභ්‍යන්තර විගණකට වැඩබැලීමේ දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු. 150,000 ක් ගෙවා තිබුණි. මෙම දීමනාව භාණ්ඩාගාරය විසින් අනුමත කර නොමැති බව පසුගිය විගණන වාර්තාවෙන් ද පෙන්වා දී තිබුණි.

**5.5 විගණන හා කළමනාකරණ කමිටු**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදයට අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මාස 03 ට වරක් පැවැත්විය යුතු අතර නමුත් සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ලේඛන පාලනය | මූලාශ්‍ර ලේඛන හා දෛනික පොත් නිසිපරිදි නඩත්තුකර නොතිබීම. |
| (ආ) | ගිණුම්කරණය | ඇතැම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත නොවීම. |
| (ඇ) | ගෙවීම් පාලනය | චක්‍රලේඛ විධිවිධාන පරිදි අදාල අනුමැතීන් ලබා නොගෙන ගෙවීම් කිරීම. |
| (ඈ) | වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා නොතිබීම හා ඌන උපයෝජිත වත්කම් පැවතීම. |
| (ඉ) | මානව සම්පත් කළමනාකරණය | අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති වීම. |